නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ 2013 මැයි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 පෙබරවාරි 25 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දිනට නගරය සහ කඩවත් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) බැංකු ගිණුම් දෙකක ශේෂයන් වශයෙන් මුදල් පොතේ දක්වා තිබුණේ රු.550,058 ක් හා රු.614,918 ක් වුවත් මූල්‍ය ප්‍රකාශ අනුව එම ශේෂයන් රු.878,315 ක් හා රු.586,446 ක් විය. මේ අනුව බැංකු ශේෂය රු.299,745 ක් වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රු. 6,230,707 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) රු.2,887,023 ක් වූ ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) 2010 වර්ෂයට පෙර ගෙවන ලද රු.309,702 ක් වූ අත්තිකාරම් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයට පෙර අනෙකුත් ආයතනයන්ට ගෙවන ලද රු.2,609,677 ක් වූ අත්තිකාරම් අයකරගෙන නොතිබුණි.

(ඇ) රු.3,2013,291 ක් වූ හිඟ ආදායම් වර්ෂ 03 කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි.

(ඇ) ණය හිමියන් 15 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.1,542,723 ක් වර්ෂ 05 කට අධික කාලයක් බේරුම් කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 79,151,944 | ඉඩම් සහ ගොඩනැගිලි ලේඛණය |
| මෝටර් වාහන | 13,690,632 | ස්ථාවර වත්කම් ලේඛණය |
| යන්ත්‍ර සූත්‍ර | 2,547,653 | |
| ණයහිමියෝ | 1,542,723 | ණයහිමි ලේඛණය |
| විවිධ තැන්පතු | 15,813,186 | කාල විශ්ලේෂණය |

1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා රීති (මූල්‍ය සහ පරිපාලන ) – 1988 | | |
| III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | සභාව විසින් සෑම කාර්තුවකටම අදාළව ඉඩම් හිමිකම් වෙනස් වීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ ඉල්ලුම් පත් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| i. මු.රෙ. 396 | - | වර්ෂ 03 කට අධික කාලයකට පෙර සභාව විසින් නිකුත් කළ එහෙත් මුදල් නොකළ එකතුව රු.10,300 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii. මු.රෙ. 880 | - | මුදල් සහ ගබඩා භාරව සිටින නිලධාරින් 04 දෙනෙකුගෙන් ප්‍රමාණවත් ආරක්ෂණ ඇප ලබාගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.5,291,015 ක් වූ අතර එයට එරෙහිව

ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.1,446,285 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,757,300 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

---------------------------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ------------------ | ------------------ | ---------- | ----------------------- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 8,804 | 8,266 | 2,292 |
| කුලී | 2,000 | 1,660 | 476 |
| බලපත්‍ර ගාස්තු | 2,231 | 1,717 | 10 |
| වෙනත් ආදායම් | 39,224 | 35,788 | 434 |

2.3 වරිපනම් හා බදු

-------------------

2008 වර්ෂයේ සිට 2013 දක්වා සභාවේ පරිපාලන ප්‍රදේශය තුල ඉදිකළ නිවාස සහ ගොඩනැගිලි සඳහා වූ එකතුව රු.1,947,465 ක් වූ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 විදුලි සංදේශ කුළුණු ගාස්තු

--------------------------------

2007 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය සඳහා විදුලි සංදේශ කුළුණු 11 ක් වෙනුවෙන් ගාස්තු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සභාවට රු.231,000 ක් වූ ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

(අ) එකතුව රු.109,340 ක් වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් ඉහත සඳහන් අයකළ මුද්දර ගාස්තු විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) ප්‍රතිලාභීන් අතර බෙදාහැරීම සඳහා කාබනික පොහොර සකස් කිරීම වෙනුවෙන් උපමාන පාදක වැඩසටහන යටතේ 2013 ජුලි 02 දින රු.498,268 ක් වටිනා බහාළුම් 158 ක් මිළදී ගෙන තිබුණි. කෙසේ වුවද වහාළුම් 158 න් රු.384,738 ක් වටිනා බහාළුම් 122 ක් බෙදා දීමකින් තොරව ගබඩාවේ තබා තිබුණි.

(ඇ) පුරනැගුම ව්‍යාපෘති අරමුදල යටතේ ඉදිකරන ලද රු.2,351,530 ක් වටිනා වෙල්ලායිමුගල් වෙළඳපොල නිම කිරීමෙන් පසුව 2012 සැප්තැම්බර් 26 දින සභාවට භාරදී තිබුණි. 2015 ජනවාරි 02 දින වනවිටත් සභාව මෙම ගොඩනැගිල්ල එම විශේෂ වූ අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වාහන 04 ක් අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් රු.239,075 ක මුදලක් වැයකර තිබුණු අතර එම වාහන සතුටුදායක ලෙස අළුත්වැඩියා කර ඇති බව සනාථ කිරීම සඳහා වැඩ සම්පූර්ණ කිරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි.

(ඉ) 2005 වර්ෂයට පෙර සාමාජිකයන්ට රැගෙන යාමට දී තිබූ පුස්තකාල පොත් 81 ක් ආපසු ලබාගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

4. කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ) වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීම

---------------------------------------

i. මාස 03 ක් ඇතුලත නිමකළ යුතු ගොඩනැගිල්ල මාස 03 ක ප්‍රමාදයකින් පසුව 2012 සැප්තැම්බර් 26 දින නිම කරන තිබුණි. ගිවිසුම ප්‍රකාරව නිම කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් අයකළ යුතු ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

ii. සාප්පු 12 කින් සමන්විත වෙළඳපොල සංකීර්ණයේ පොළව කොන්ක්‍රීට් දැමීම සඳහා රු.94,998 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද නියමිත ප්‍රමිතියට අනුව කොන්ක්‍රීට් දැමීම සිදුකර නොතිබුණු අතර සමස්ථ පොළොව පුපුරා තිබුණි.

(ආ) ආදාහනාගාරය පිරිසිදු කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී කින්නියා ආදාහනාගාරය පිරිසිදු කිරීම සඳහා ඩෝසර් යන්ත්‍ර යොදා ගැනීම සඳහාරු251,500 ක මුදලක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. රු.100,000 ක් ඉක්මවන සැපයුම් සහ සේවා ප්‍රසිද්ධ තරඟකාරී මිළ කැඳවීමට භාජනය විය යුතු බවට ප්‍රාදේශිය සභා මූල්‍ය රීති vii පරිච්ඡේදයේ 78 වගන්තිය මගින් නියම කර ඇත. නමුත් ප්‍රසිද්ධ තරඟකාරි මිළ කැඳවීමක් සිදු නොකොට එම කාර්යයය පවරා තිබුණි.

ii. පැය 50 ක් වැඩකළ බව සනාථ කිරීම සඳහා කාර්මික නිලධාරියාගෙන් සහතිකයක් ලබා නොගෙන ඩෝසර් පැය 50 ක කාලයක් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදුකර තිබුණි.

4.1 නිශ්ක්‍රීය වත්කම්

------------------

පහත සඳහන් වත්කම් සභාවේ නිෂ්ක්‍රීයව තිබුණි.

| වත්කම් විෂයය | ප්‍රමාණය | ඌන උපයෝජිත කාල පරිච්ඡේදය |
|---|---|---|
| වීල් බැරෝ | 20 | වර්ෂ 04 |
| රෝනියෝ යන්ත්‍ර | 02 | |
| යතුරු පුවරු | 03 | |
| කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර | 01 | වර්ෂ 03 |
| දොර අගුළු | 06 | වර්ෂ 02 |
| ජල පෙරනයන් | 03 | වර්ෂ 01 |

5. මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක මට්ටම | 01 | 01 | - | - |
| ද්විතීයික මට්ටම | 27 | 23 | 04 | - |
| තෘතීය මට්ටම | 61 | 45 | 16 | - |
| වෙනත් | - | 70 | - | 70 |

6. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 3 සහ 2005 නොවැම්බර් 08 දිනැති චක්‍රලේඛ මගින් දී ඇති උපදෙස් ප්‍රකාර වූ සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතුය. නමුත් සභාව විසින් අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

6.2 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් පිළියෙල කරන ලද තථ්‍ය වියදම් ප්‍රකාශය සහ අයවැයගත වටිනාකම් අතර 39%-93% දක්වා පරාසයක වූ විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව පෙනී යයි.

6.3 පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

i. ගිණුම්කරණය
ii. ස්ථාවර වත්කම් පාලනය
iii. ආදායම් එකතු කිරීම
iv. ප්‍රසම්පාදන පරිපාටිය
v. කොන්ත්‍රාත් පරිපාලනය